# වර්තමාන භික්ෂු අධ්‍යාපනය විෂයයෙහි පිරිවෙන් පුස්තකාලවල දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්

## (කොළඹ සහ අනුරාධපුර දිස්ත්‍රික්ක ඇසුරිනි)

බෝදාගම සුමන හිමි[1], කුඹුගොඩආරේ පඤ්ඤාලෝක හිමි[2]

### හැඳින්වීම

"ගස් පට්ටාවල හෝ තල්පත්වල ලියන ලද දැනට භාරතයේ සොයාගෙන ඇති පැරණිතම අත් පිටපත් අයත් වන්නේත් ගල්වල හෝ ලෝහ තහඩුවල හෝ ලියවී ඇති පැරණිතම ලේඛන අයත් වන්නේත්, ධර්ම ග්‍රන්ථ අධ්‍යාපනය සඳහා පවත්වා ගැනීමට ලේඛන කලාව පළමුවෙන් ම උපයෝගී කරගැනීමේ ගෞරවය අයත් වන්නේත්, බෞද්ධයන්ට ය කියා අප පුදුම නොවිය යුතු ය. " (නිකාය සංග්‍රහය : 19 - 28 ) අධ්‍යාපනය වනාහි මානව පරිකල්පන ශක්තියේ තාර්කිකභාවයයි. මානව වංශකථාවේ ආරම්භයේ සිට ම කුතුහලයෙන් පිරුණු මිනිසා ගින්දර සොයා ගත්තේත්, අනෙකුත් අවශ්‍යතාවන් සපුරා ගත්තේත් යම් අධ්‍යයන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙසිනි. එකී මානව දැනුම ගල් පුවරු, ගස් මතුපිට, මැටි පුවරු මත සුරක්ෂිත විය. පෙරදිග ඥාන තක්සලාවේ මූලය ඉන්දියාවෙන් ආරම්භ වී සාමන්ත දේශයන් දක්වා විහිද ගිය බවක් ඉතිහාසය තොරතුරු අනුව දැක ගත හැකිය. ලිඛිත හා අලිඛිත මූලාශ්‍රයවලට අනුව ශ්‍රී ලංකාවේ පැරණිතම සම්භාව්‍ය අධ්‍යාපනය ක්‍රමවේදය භික්ෂු අධ්‍යාපනය ලෙස හඳුනාගෙන ඇත. මිහිඳු හිමියන්ගේ "මෙම දිවයිනෙහි මව්පිය දෙපළකට දාව උපත ලබා මෙහිම පැවිදිභාවයට වූ භික්ෂුවක් විනය ඉගෙන විනය උගන් වන්නෙනම් එවිට බුදු සසුන මෙම දිවයිනෙහි මුල් බැස ගන්නවා ඇත." යන අනුශාසනය අනුව අරිට්ඨ හිමි ථූපාරාමයේ දී භික්ෂු සංඝයා මැද විනය ඉගැන්වීමත් සමඟම බෞද්ධ අධ්‍යාපනයේ මූලාරම්භය සිදු විය. ඉන් අනතුරුව දෙවන පෑතිස් රජු විසින් තනවන ලද කාලප්‍රාසාද පිරිවෙනින් ඇරඹි මෙරට භික්ෂු අධ්‍යාපනය අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි, යාපහු, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ හා මහනුවර යුග පසුකරමින් නූතනය වන විට යම් සංවර්ධිතභාවයකට පැමිණ ඇත. භික්ෂු අධ්‍යාපනය උදෙසා ආරම්භ වූ මෙම අධ්‍යාපන මධ්‍යස්ථාන පිරිවෙන්, පාරිවේණික, ආරාමික, මූලායතනය යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

---

[1] ආධුනික කථිකාචාර්ය, සමාජ විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, bsumana@busl.ac.lk

[2] ආධුනික කථිකාචාර්ය, සමාජ විද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර

ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි පිරිවෙන් යන්නෙහි වචනාර්ථය දක්වා ඇත්තේ මෙසේය. "පිරිවෙන් - 1. මහාවිහාරයක් තුළ තිබෙන සංඝාවාස විශේෂයක් 2. භික්ෂූන් විසින් පවත්වන විද්‍යාස්ථානය 'පිරිවෙන් "නම්. (සුමංගල ශබ්දකෝෂය : 2: 10) ඉහත අරුත් දැක්වීමට අනුව පිරිවෙන භික්ෂූන් වාසය කරන සංඝාරාම විශේෂයක් ලෙස ද, අධ්‍යාපන ආයතනයක් ලෙස ද අර්ථ දක්වා ඇත. එසේම මුල් කාලීනව පිරිවෙන යන්න භාවිත කර ඇත්තේ විශාල සංඝාවාස, භික්ෂු ආරාම සඳහාය. මෙම බැව් චුල්ලවග්ගපාළියෙහි දක්වා ඇත්තේ මෙසේය. "අනුජානාමි භික්ඛවෙ පරිවෙණග්ගෙන දාපෙතුං" (චුල්ලවග්ගපාළිය) යනුවෙන් ද, "සංඝමජ්ඣං ඔකරිත්වා වසමානාපි දූරපරිවෙණතාල - නාරිකෙල ආදීනි රොපෙත්වා" (සංයුක්තනිකාය අටුවාව) යනුවෙන් ද පිරිවෙන යන්න සංඝාරාම සඳහා භාවිත කර ඇති බව පෙනේ. මෙහි දී විශාල ආරාම සංකීර්ණ සඳහා පිරිවෙන් යන නාමය යොදාගත්ත ද සෑම ආරාමික සංකීර්ණයක්ම අධ්‍යයන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වී ඇත. පශ්චාත්කාලීනව භික්ෂු අධ්‍යාපනය සඳහා පිහිටුවා ගන්නා ලද ආයතනයන් පිරිවෙන් ලෙස හඳුන්වා ඇත. වර්තමානය වන විට දිවයින පුරා පිරිවෙන් 747 පමණ තිබෙන බව 2014 - මහබැංකු වාර්තාවේ හා පිරිවෙන් අමාත්‍යාංශ වාර්තාවල දැක්වේ. මෙම පිරිවෙන් මූලික පිරිවෙන්, මහ පිරිවෙන් හා විද්‍යායතන පිරිවෙන් යනුවෙන් ප්‍රභේද තුනක් යටතේ පවත්වාගෙන යනු ලබයි. මෙම පාරිවේණික මධ්‍යස්ථාන එදා සිට අද දක්වා ම භික්ෂුවගේ අධ්‍යාපනය, විනය, නායකත්වය හා පෞරුෂ සංවර්ධනය කරන අතර ම මෙරට සාහිත්‍යයේ ප්‍රගමනය සිදුව ඇත්තේ ද මේ ආයතන කේන්ද්‍රකර ගනිමිනි.

ප්‍රධාන ආරාමික ස්ථාන කේන්ද්‍ර කරගනිමින් මෙකී අධ්‍යාපනික ආයතන ගොඩනැංවුණු අතර මෙම ආයතනයන්හි සුවිශේෂි අංගයක් ලෙස පිරිවෙන් පුස්තකාලය පෙන්වා දිය හැකිය. පුස්තකාලයක් යනු පොත් තැන්පත් කර තිබෙන ගෘහය හෝ ස්ථානය වේ. පොත් ගුල්, පොත් ගෘහ, ග්‍රන්ථාගාරය යන අපර නම්වලින් ද මෙය හඳුන්වනු ලැබේ. අනුරාධපුර, පොළොන්නරු යුගයන්හි පිරිවෙන් ආශ්‍රිතව පුස්තකාල තිබුණු බවට මහාවංසය සාක්ෂ්‍ය දරයි. මහාවිහාරය, අභයගිරිය, ජේතවනය හා තදනුබද්ධ අෂ්ට මූලායතනයන්හි ද, අනෙකුත් පාරිවේණික ආයතනයන්හි ද මූලාශ්‍රය භාවිතය සඳහා පොත්ගුල් ස්ථාපනය කර තිබූ අතර දෙස් - විදෙස් උගතුන් තම ලේඛනයට හා ශාස්ත්‍ර අධ්‍යයනයට එම පුස්තකාල භාවිත කර ඇති බව වංශකථාවල එන තොරතුරු අනුව පැහැදිලි වේ. බුද්ධඝෝස, බුද්ධදත්ත හා ධම්මපාල යන හිමිවරුන් අට්ඨකථාකරණය සඳහා මහාවිහාරික පුස්තකාලයවල තිබූ ග්‍රන්ථ පරිහරණය කර ඇති බව දැක්වීමෙන්ම ඒ බව පැහැදිලිය.

වංසකථාවන්හි දක්වෙන පොත්ගුල් වෙහෙර, පොත්ගුල් කන්ද යනුවෙන් දක්වා ඇති ස්ථාන එකල තිබූ විශාල පොත්ගුල් විය හැකිය. පශ්චාත් කාලීනව කෝට්ටේ යුගය වන විට තොටගමු වෙහෙර, විජයබා පිරිවෙන, සුනේත්‍රා දේවී පිරිවෙන ආදී පිරිවෙන් ආශ්‍රිතව දියුණු පුස්තකාල පද්ධතියක් තිබෙන්නට ඇති බව මෙකී යුගයේ නිර්මාණය වූ කෘතින්ගෙන් මෙන් ම නිර්මාණවලට දායක වූ රචකයන්ගේ ලේඛන ප්‍රතිභාවෙන් ද අවබෝධ කර ගත හැකිය. නූතනය වන විට පිරිවෙන් බොහෝ ප්‍රමාණයක් ස්ථාපනය කර තිබුණ ද භික්ෂුවගේ දැනුම් මට්ටම හා චින්තන ප්‍රතිභාව ක්ෂය වෙමින් පවතින බව කෘතහස්ත ලේඛකනයන් බිහිනොවීමෙන් පෙනේ. මේ සඳහා එක් හේතුවක් ලෙස ක්‍රමවත් පුස්තකාල පද්ධතියක් නොතිබීමත්, සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවේදයෙන් බැහැරවීමත් හේතු වී ඇත. පුරාණයේ සිට ම අද දක්වා ම භික්ෂුව ගමේ නායකයා විය. දැනුමෙන් ද යුක්ත විය. විටෙක වෛද්‍යවරයෙක් ද, විටෙක ධර්ම දේශකයෙක් ද, තවත් විටෙක හොඳ මනෝ උපදේශකයෙක් ද විය. මේ අනුව ආගමික කටයුතු, ධර්ම දේශනා, අනුශාසනා, උපදේසනා ආදී කිනම් කටයුත්තක් සඳහා වුව ද යම් කියවීමක්, අධ්‍යයනයක් අවශ්‍ය වන අතර එම කටයුතු සඳහා පරිපූර්ණ දැනුමක් ලබා ගැනීමට පිරිවෙන් පුස්තකාලවලින් ලැබෙන දායකත්වය අති මහත්ය. මේ අනුව බෞද්ධ අධ්‍යාපන මෙරට මුල් ම අධ්‍යාපන ක්‍රමවේදය වන අතර ම මෙරටෙහි පළමුව පොත්ගුල් ඇති කිරීමේ ගෞරවය ලාංකේය භික්ෂුව සතු වන බව ශ්‍රී ලංකාවේ පොත්ගුල් ඉතිහාසය පිළිබඳ අවධානය යොමු කිරීමෙන් මනාව පැහැදිලි වේ.

## පර්යේෂණ ගැටලුව

පාරිවේණික පුස්තකාලයන් ආරාමික අධ්‍යාපනයේ හදවත වැනිය. අනුරාධපුර යුගයේ සිට 19 වන සියවස දක්වාම මෙරට සාහිත්‍යය හා සංස්කෘතියේ ප්‍රෞඪ උරුමය පිරිවෙන් ආශ්‍රිතව ගොඩනැංවුණු අතර ඥාන සම්ප්‍රේෂණය පිරිවෙන් පුස්තකාල හරහා සිදු විය. මෙරට ආරාමික අධ්‍යාපනය හා පුස්තකාල වඩාත් සංවර්ධිත වූවක් වූ අතර දෙස් විදෙස් උගතුන්ගේ නොමඳ පැසසුමට ද ලක්විය. එහෙත් අතීතයේ සිට ග්‍රන්ථකරණයේ හා ශාස්ත්‍ර උද්දීපනයෙහි යෙදුණු භික්ෂුවගේ උරුමය වර්තමානය වන විට ගිලිහි ගොස් ඇති බව පෙනේ. නවීන අධ්‍යාපන ක්‍රමවේදයන් පිරිවෙන් අධ්‍යාපනයට සම්බන්ධ කර ගැනීමත්, පිරිහී ගිය පුස්තකාල පද්ධතියක් තිබීමත් මේ සඳහා හේතු වී ඇත. මේ අනුව වත්මනෙහි පිරිවෙන් අධ්‍යාපනය විෂයෙහි පිරිවෙන් පුස්තකාල දක්වනු ලබන දායකත්වය ප්‍රමාණවත් ද යන්න විමසා බැලීම මෙහි දී සිදු කරනු ලබයි. මෙහි දී එම පුස්තකාලයන්හි එකතු කළමණාකරණය, ග්‍රන්ථ වර්ගීකරණය, ග්‍රන්ථ පරිශීලනය ආදී පුස්තකාලයීය කාර්යයන් පිළිබඳව ද, පිරිවෙන් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳව

විමසා බැලීම මෙහි දී සිදු කෙරේ. තව ද මෙම පිරිවෙන් පුස්තකාලවලින් භික්ෂු අධ්‍යාපනය, සාමාන්‍ය අධ්‍යාපනය, අවිධිමත් අධ්‍යාපනය යන කරුණුවල දී ලැබෙන දායකත්ව ද විමසනු ලැබේ.

උපන්‍යාසය

1. ශ්‍රී ලංකාවේ ආරාමික පුස්තකාලවල, පුස්තකාල දැනුම සංවිධානය, එකතු සංවර්ධනය සහ නව දැනුම් මාධ්‍ය භාවිතය අවම මට්ටමක පවතී.

අධ්‍යයන ක්‍රමවේදය

**දත්ත එකතු කිරීම**

මෙම අධ්‍යයනයේ දී ක්‍රමවේද 03ක් භාවිත කරමින් ප්‍රාථමික දත්ත එක් රැස් කර ගැනීම සිදු කෙරේ.

**නිරීක්ෂණය**

නියැදිකරණයෙන් තෝරාගත් පිරිවෙන් වෙත ගොස් එහි පුස්තකාලවල ස්වභාවය, පිහිටීම, පොත් සඳහා භාවිත ශිල්පීය ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනය කරනු ලැබේ.

**සම්මුඛ සාකච්ඡා**

වර්තමානයේ දී පිරිවෙන් පුස්තකාල භික්ෂු අධ්‍යාපනය සඳහා කොතෙක් භාවිත වේද? භාවිතයේ දී මුහුණ පා ඇති ගැටලු මොනවාද යන්න පිළිබඳ අදහස් විමසීම. පුස්තකාල සංවර්ධනය සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට අපේක්ෂිතය.

ප්‍රශ්නාවලි ලබාදීම

කොළඹ සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි තෝරා ගන්නා ලද පිරිවෙන් සඳහා ප්‍රශ්නාවලී ඉදිරිපත් කිරීම. මෙහි ප්‍රශ්නාවලී ගුරුවරුන් (පුස්තකාල භාර) සඳහා ලබා දෙන අතර එමගින් පහත තොරතුරු ලබා ගැනීම.

ප්‍රශ්නාවලි ලබාදීම මඟින් ලබාගත් දත්ත විශ්ලේෂණය කර සංඛ්‍යා වගු හා ප්‍රස්ථාර භාවිතය මඟින් ද එම දත්ත විශ්ලේසන්‍ය කර ඉදිරිපත් කෙරේ.

අධ්‍යයනයේ අරමුණු

භික්ෂු අධ්‍යාපනය උදෙසා පාරිවේණික පුස්තකාලවල දායකත්‍වය පිළිබඳ සිදු කරන ලද මෙම පර්යේෂණයේ අරමුණු මෙසේ දැක්විය හැකිය.

- දැනට පිරිවෙන් පුස්තකාල මුහුණ දෙන ප්‍රධාන ගැටලු හඳුනා ගැනීම

- භික්ෂු අධ්‍යාපනය සඳහා පිරිවෙන් පුස්තකාලවල කාර්යභාරය හඳුනා ගැනීම
- පුස්තකාල එකතුව හා දැනුම සංවිධාන හඳුනාගැනීම
- නවීන තොරතුරු මූලාශ්‍ර භාවිතය සඳහා පිරිවෙන් පුස්තකාල යොමු කිරීම
- පුස්තකාල ප්‍රමිතීන්ට අනුගතව පිරිවෙන් පුස්තකාල ගොඩනැංවීමට සහායවීම

පර්යේෂණයේ වැදගත්කම

මෙම පර්යේෂණය මගින් පිරිවෙන් පුස්තකාලයන්හි මානව හා භෞතික සම්පත්හි සංවර්ධනය හා ප්‍රගමනය උදෙසා ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යයනය කරනු ලබන අතර එමඟින් සංවර්ධිත පාරිවේණික පුස්තකාල පද්ධතියක් ගොඩනැංවීට අවශ්‍ය මූලික පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිය. මීට අමතරව මෙම අධ්‍යයනය මගින්

- පාරිවේණික පුස්තකාල මුහුණ දෙන හඳුනාගත් ගැටලු සඳහා පිළියම් යෝජනා කිරීම
- පුස්තකාලයීය ප්‍රමිති භාවිත කිරීමට උනන්දු කිරීම
- පාරිවේණික පුස්තකාලයීය ව්‍යවස්ථාවක් සඳහා මඟ පෙන්වීම

යන කරුණු සඳහා මෙම අධ්‍යයනය මගින් සොයා ගනු ලබන කරුණු උපයෝගී කර ගත හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ

*නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය.* (1988). (සංස්.) ගුණවර්ධන නානායක්කාර, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

අබේසිංහ, වික්‍රමනායක. (1999). *පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය.* විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුල්ලේරියාව.

අදිකාරම්, ඊ. ඩබ්ලිව්. (1969). *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය.* කොළඹ: ජයවර්ධන සහ සමාගම.

අදිකාරි, අබයරත්න. (2002). *ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන.* නුගේගොඩ: තිව්ර ප්‍රකාශන.

අදිකාරි, අබයරත්න. (2002). *ශ්‍රී භික්ෂු අධ්‍යාපනය හා අධ්‍යාපන නීති.* කොළඹ: ගොඩගේ.

අමරවංශ හිමි, කොත්මලේ. (1969). *ලක්දිව සෙල්ලිපි.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.